# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2395/13 - 2024 ජූලි මස 30 වැනි අඟහරුවාදා - 2024.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 13 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනතින්, 2019 අංක 11 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතින්, 2006 අංක 35 දරන පනතින්, 1982 අංක 52 දරන පනතින් සහ 1976 අංක 27 දරන නීතියෙන් සංශෝධිත 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත**

2021 අංක 13 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනතින්, 2019 අංක 11 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතින්, 2006 අංක 35 දරන පනතින්, 1982 අංක 52 දරන පනතින් සහ 1976 අංක 27 දරන නීතියෙන් සංශෝධිත 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4 (අ) 1 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මම, දකුණු පළාතේ සියලුම පළාත් පාලන ආයතනයන්හි එකඟතාවය මත පහත පළමු උපලේඛනයේ විස්තර කොට ඇති මායිම් තුළ ඇති ජලය බැස යන හෝ ජලය බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ නිර්මාණය වී ඇති, පහත පළමු උපලේඛනයේ දැක්වෙන මායිම් තුළ වූ සියලු ඇළ මාර්ග, අතුරු ඇළ මාර්ග හා පෝෂක ඇළ මාර්ගවල දෙපස ඉවුරේ සිට එකී ඇළ මාර්ගවල මතුපිට පළලට අනුරූපීව මෙහි පහත දෙවන උපලේඛනයේ සඳහන් දුර ප්‍රමාණයන් ඇළ රක්ෂිත වශයෙන් නිශ්චය කොට ප්‍රකාශයට පත්කරමි. මෙම ඇළ රක්ෂිත ප්‍රදේශයේ කිසියම් ස්ථිර හෝ තාවකාලික හෝ/හා වෙනත් ආකාරයක ගොඩනැගිලි හෝ ව්‍යුහ ඉදිකරනු නොලැබිය යුතු අතර, එකී රක්ෂිත තුළ සිදු කරනු ලබන කිසියම් හෝ කටයුත්තක් සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් නියම කරනු ලබන මෙහි තුන්වන උපලේඛනයේ සඳහන් හා/හෝ ඉදිරියේ දී කලින් කලට පනවනු ලබන කොන්දේසි හා නියමයන්ට යටත්ව එකී සංස්ථාව වෙතින් ලිඛිත අවසරයක් ලබාගත යුතුය.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජූලි මස 19 වැනි දින,

1A - G 42337— 05 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමු උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත තුළ පිහිටි -

*උතුරට* : බෙන්තොට ගඟ, කළුතර, රත්නපුර, මොණරාගල හා අම්පාර යන පරිපාලන දිස්ත්‍රික්ක මායිම්

*නැගෙනහිරට* : කළුතර, රත්නපුර, මොණරාගල හා අම්පාර පරිපාලන දිස්ත්‍රික්ක මායිම් හා ඉන්දියන් සාගරය

*දකුණට* : ඉන්දියන් සාගරය

*බස්නාහිරට* : කළුතර, රත්නපුර, මොණරාගල යන පරිපාලන දිස්ත්‍රික්ක මායිම් හා ඉන්දියන් සාගරය

දෙවන උපලේඛනය

| *ඇළෙහි මතුපිට පළල (මීටර්)* | *ඇළ ඉවුරේ මායිමේ සිට රක්ෂිතය* | |
|---|---|---|
| | *විවෘත ඇළ සඳහා (මීටර්)* | *මතුපිට ආවරණය කරන ලද ඇළ සඳහා (මීටර්)* |
| 1.0 - 1.2 දක්වා | 1.0 | 0.3 |
| 1.3 - 3.0 | 2.0 | 1.0 |
| 3.1 - 4.5 | 2.75 | 1.0 |
| 4.6 - 6.0 | 3.5 | 1.5 |
| 6.1 - 9.0 | 4.5 | 1.5 |
| 9.0 ට වැඩි | 6.5 | 2.0 |

ඉහත රක්ෂිත සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන විසින් හා රජයේ ඉඩම් ආඥාපනත යටතේ ප්‍රකාශ කර ඇති දුර ප්‍රමාණ, මෙම ප්‍රකාශයේ රක්ෂිත ප්‍රමාණයන්ට වැඩිවන අවස්ථාවක එම ආයතනය/ආඥාපනත් විසින් ප්‍රකාශ කරනු ලබන රක්ෂිත තැබිය යුතුවේ.

තෙවන උපලේඛනය

**කොන්දේසි හා නියමයන්**

a) ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරිගේ ලිඛිත අනුමැතිය නොමැතිව ඇළ රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත ඇළ රක්ෂිත ප්‍රදේශ තුළ කිසිදු ආකාරයක ගොඩනැගිලි හෝ ව්‍යුහ ඉදිකිරීමක් සහ/හෝ ගොඩකිරීමක් නොකළ යුතුය.

b) දෙවන උපලේඛනයේ සඳහන් පරිදි, අවම අදාළ ඇළ රක්ෂිත ප්‍රමාණය ක්ෂේත්‍රයේ තිබිය යුතුය.

c) මෙම ප්‍රකාශිත ඇළ රක්ෂිත තුළ ඇති යම් ඇළකට සංස්ථාවේ අනුමැතියකින් තොරව වැසි ජල කාණු සම්බන්ධ නොකළ යුතු අතර, මළ නල, කර්මාන්ත අපද්‍රව්‍ය හෝ කිසිදු දූෂක කාරකයක් දැමීම බැහැර කිරීම හෝ එසේ කරනු ලැබීමට සැලැස්වීම නොකළ යුතුය.

d) කිසිදු විකල්ප මාර්ගයක් නොමැති අවස්ථාවලදී පමණක් ඇළ රක්ෂිතය ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කළ හැකි වුවත්, එම මාර්ගය මත ගල් අතුරා තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම හෝ වෙනත් ඇතිරීමක් සිදු නොකළ යුතුය.

(e) එවැනි ඇළ මාර්ගයක රක්ෂිතයක් තුළ වාණිජ කටයුතු හෝ වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම සඳහා බදු වශයෙන් ලබාදීම, පුද්ගලයෙකු, සමිතියක්, ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් නොකළ යුතුය.

(f) ඇළ රක්ෂිත ලෙස ප්‍රකාශිත ප්‍රදේශයට ඇතුළත් ඉඩම් කොටස් තුළ රථ වාහන ගාල් කිරීම, ගරාජ් සඳහා භාවිතා කිරීම, වගා කටයුතු කිරීම නොකළ යුතුයි.

g) ප්‍රකාශිත ඇළ රක්ෂිත තුළ කරනු ලබන ඕනෑම කාර්යයක් සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

h) ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පනතේ කාර්යයන් සඳහා බලය පවරනු ලැබූ ඕනෑම තැනැත්තෙකුට අදාළ ප්‍රකාශිත ප්‍රදේශය තුළට ප්‍රවේශ වීම සඳහා අවසර ඇති අතර, කිසිදු අයෙකු විසින් ඊට බාධා කරනු ලැබුවහොත් පනත යටතේ ඔහු/ඇය වරදකරුවෙකු කළ හැකි වේ.

i) මෙම නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තෙකුම සංස්ථා පනත යටතේ වරදකරුවෙකු වේ.

j) මේ සම්බන්ධයෙන් දැනට පනවනු ලබන කොන්දේසි හා නියමයන්ටද ඉදිරියේදී පනවන කොන්දේසි හා නියමයන්ටද යටත් විය යුතුය.

EOG 07 - 0281

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.